# ධර්ම දානය පිණිසයි !

## නියතො සම්බොධි පරායනො

# නියත වූ උතුම් සෝවාන් ඵලය උදෙසා

සියලු සත්වයෝ අප්‍රමාණ දුක්ඛස්කන්ධයකින් පෙළෙමින් අනන්ත දුක් ගින්දරෙන් දැවෙමින් පසුවන්නා වූ සසරම වූ කලී ගැටළුවයි. සියලු ලෝ සතුන් ජරා මරණ සහිත අප්‍රමාණ සසර දුක්ඛ අන්ධාකාරයෙන් මුදවා සදාතනික අජරමාර සැපයට පමුණුවන්නා වූ නිවනම වූ කලී ඒකායන විසඳුමයි.

එකී සසර නම් වූ ගැටළුව විසඳන, නිවන නම් වූ සදාතිනක විසඳුම ළඟා කර දෙන, විශ්වයේ මහා විද්‍යාඥ, මහා ශාස්තෘවර ලොව්තුරු තථාගත සම්මා සම්බුදු පියාණන් වහන්සේ පෙන්වා දෙන පරම උත්තරීතර බෞද්ධ විද්‍යාත්මක ක්‍රමය නම් කුමක්ද ?

1. **ප්‍රශ්නය හඳුනාගැනීම**
2. **ප්‍රශ්නය හට ගැනීමට හේතුව**
3. **ප්‍රශ්නය විසදීම**
4. **ප්‍රශ්නය විසදාගැනීමේ ක්‍රමවේදය / මාර්ගය / ප්‍රතිපදාව**

# බෞද්ධ විද්‍යාත්මක චින්තනය

## 1. ප්‍රශ්නය හඳුනාගැනීම

**නිමක් නැති චිත්ත පීඩා / මානසික දාහය / මානසික සංකූලනතා - ව්‍යාකූලතා / මානසික බිඳවැටීම් / අසහනය / ආතතිය / විශාදය / අතෘප්තිය / භය / ශෝකය / පරිදේවය / දුක්ඛ දෝමනස්ස / උපායාස**

## 2. ප්‍රශ්නය හට ගැනීමට හේතුව

**සාවද්‍ය චින්තනය / සිතීමේ වැරැදි රටාව / විකෘති චින්තනය**

## 3. ප්‍රශ්නය විසදීම

**නිරවද්‍ය චින්තනය / සිතීමේ නිවැරැදි රටාව / ප්‍රකෘති චින්තනය**

## 4. ප්‍රශ්නය විසදාගැනීමේ ක්‍රමවේදය / මාර්ගය / ප්‍රතිපදාව

**නිරවද්‍ය චින්තනය ප්‍රගුණ කිරීම / ප්‍රකෘති චින්තනයෙන් යුක්තව වාසය කිරීම**

සත්වයාගේ චින්තනය මූල දෙකකින් යුක්ත වේ.

## අවිජ්ජා මූලය

## විජ්ජා මූලය

මින් අවිජ්ජා මූලයෙන් ඇරඹෙන චින්තනය සසර දුක්ඛස්කන්ධය නිර්මාණය කරයි. දුකම විඳිමින් නැවත නැවත දුක පසුපසම ලුහුබඳින අර්ථයෙන් මෙය අනාර්ය නොහොත් අනුලෝම චින්තනය වෙයි.

විජ්ජා මූලයෙන් ඇරඹෙන චින්තනය නිවනින් කෙළවර වෙයි. (දුක්ඛස්කන්ධය නිමා කරයි). දුක අවබෝධ කරමින් දුකින් නිදහස් වන අර්ථයෙන් මෙය ආර්ය නොහොත් පටිලෝම චින්තනය වෙයි.

සසර දුක් උසුලන සත්වයෙකු නිර්මාණය වන්නේ මෙම අවිජ්ජා මූලයෙන් ඇරඹෙන මුළා සහගත චින්තනය තුළයි.

සසර දුක්ඛස්කන්ධය නම් සත්වයා අවසන් වන්නේ විජ්ජා මූලයෙන් ඇරඹෙන යථාර්ථවාදී චින්තනය නොහොත් යථාභූත ඥාණ දර්ශනය තුළයි.

අති උත්තරීතර බුදු දහම තුළින් උදා කර දෙන්නේ මෙම විද්‍යාත්මක චින්තනය නොහොත් විජ්ජා මූලයෙන් ඇරඹෙන යථාභූත ඥාණ දර්ශනයයි.

## ආර්ය විනය තුළ පෙන්වන දුක්ඛ ආර්ය සත්‍යය යනු කුමක්ද ?

ලෝකය තුළ දුක යනුවෙන් අර්ථකථනය වන ස්වභාවයක් ඇත. ලෝකය තුළ දුක යනු සත්වයා අත් විඳින්නකි. වේදනා චෛතසිකයෙන් (වේදනා හැඟීමෙන්) අත් දකින්නකි. එම ලෞකික අර්ථයෙන් යුත් දුක, සත්වයාට ඇසින් ද දැකිය හැක. එම ආදීනව දුක් සමුදාය ලෝකය තුළ පැහැදිලිව විද්‍යාමාන ය. ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ (කායික දුක්), දෝමනස්ස (මානසික දුක්), උපායාස යන දුක්ඛස්කන්ධය සියලු ලෝ සතුන්ට උරුම ධර්මතාවන් ය. සියලු සතුන්ට මෙම දුක් රැස පෙනේ. සත්වයාට මෙම දුක්ඛස්කන්ධය පෙන්වා දෙන්නට සම්මා සම්බුදුවරයාණන් වහන්සේ නමක් අවැසි නැත.

එසේ නම් සම්මා සම්බුදු රජුන් අපට පෙන්වා දෙන දුක්ඛ ආර්ය සත්‍යය කුමක්ද ?

ද්වයතානුපස්සනාසුත්තං

**රූපා සද්දා රසා ගන්ධා, ඵස්සා ධම්මා ච කෙවලා**
**ඉට්ඨා කන්තා මනාපා ච, යාවතත්ථීති වුච්චති**

ඉෂ්ට, කාන්ත, මනාප, මන වඩන රූප, ශබ්ද, රස, ගන්ධ, ස්පර්ශ, ධර්ම යන මේ අරමුණු සය කෙරෙහි සියලු සත්වයෝ නිරන්තරයෙන් යොමු වී සිටිති.

**සදෙවකස්ස ලොකස්ස, එතෙ වො සුඛසම්මතා**
**යත්ථ චෙතෙ නිරුජ්ඣන්ති, තං නෙසං දුක්ඛසම්මතං**

දෙවියන් සහිත ලොකයා විසින් එකී ප්‍රිය අරමුණු සහ එතුළින් උපදින ආස්වාදය ලෝකයේ සැපයයි සම්මතය. යම් තැනෙක්හි මොව්හු නැතිවෙත්ද, අභිමි වෙත්ද, වෙන් වී යත්ද, එය ලෝකයේ දුක යයි සම්මත ය.

**සුඛන්ති දිට්ඨමරියෙහි, සක්කායස්සුපරොධනං**
**පච්චනීකමිදං හොති, සබ්බලොකෙන පස්සතං**

පංච උපාධානස්කන්ධයේ නිරෝධය (මම මගේ යයි ආශාවෙන් අල්ලාගෙන සිටින පංචස්කන්ධය අත් හැරීම ) සැපය යයි ආර්යයන් විසින් දක්නා ලදී. ආර්යයන්ගේ එම දැක්ම සියලු ලෝකයන්හී දැක්මට ප්‍රතිගාමී ය.

**යං පරෙ සුඛතො ආහු, තදරියා ආහු දුක්ඛතො**
**යං පරෙ දුක්ඛතො ආහු, තදරියා සුඛතො විදූ**

අනාර්‍යයෝ යමක් සැපයයි කීවාහුද, ආර්යයෝ එය දුක්යයි කීහු. අනාර්‍යයෝ යමක් දුක් යයි කීවාහුද, ආර්යයෝ එය සැපයයි කීවාහු ය. ලෝකයා ආස්වාදයට සැප යයි කීවාහු ය. ආස්වාදයෙන් වෙන්වීමට දුක යයි කීවාහු ය. ආර්යයෝ ආස්වාදයට දුක යයි කීවාහු ය. ආස්වාදයෙන් වෙන්වීමට සැප යයි කීවාහු ය.

නිවන් අවබෝධය යනු ලෝකයේ දැක්මට - චින්තනයට ප්‍රතිගාමී අවබෝධයකි. ලෝකයේ දැක්ම වන්නේ රාගය, ද්වේෂය, මෝහය පවත්වාගෙන යාම සැපයකි යන්නයි. එම රාග, ද්වේෂ, මෝහ සිත තුළ ජනනය කිරීමට හේතු වන, ආස්වාදය සැපයකි යන්නයි.

නමුත් තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොවට හෙළි කළ පටිච්ච සමුප්පාද ධර්මයට (හේතු ඵල ධර්මය) අනුව නුවණින් දැකිය හැක්කේ, ආස්වාදය සැපයක් ලෙස සලකා ඒ පසුපස හඹා යාම හේතුවෙන්, සිත තුළ නැවත නැවත රාග, ද්වේෂ, මෝහ ජනනය වන ආකාරයයි. එම රාග, ද්වේෂ, මෝහ හේතුවෙන් නැවත නැවත කර්ම භවය සකස් වේ. කර්ම භවය හේතුවෙන් සත්වයාට මරණින් පසු නැවත උපතක් හිමි වේ. නැවත දුක්ඛස්කන්ධය උරුම වේ.

සත්වයාට මෙලොවත් පරලොවත්, දැවීම, අසහනය, පෙළීම, පීඩාව, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස දුක් රැස උරුම කර දෙන, රාග, ද්වේෂ, මෝහ හට ගැනීමට හේතුව වන්නේ ආස්වාදයයි. අනවරාග්‍ර අනාථ සසර ගමනක සියලු සතුන් මෙලොව පරලොව වශයෙන් අනන්ත අපරිමාණ දුකක් උරුම කරගන්නේ ආස්වාදය පසුපස සැපයකි යන මිත්‍යාදෘෂ්ඨියෙන් යුක්තව හඹා යාම නිසා ය. යමකින් යමකින් දුක උරුම වන්නේ නම් එය සැපයක් ලෙස සැලකිය නොහැක.

එහෙයින් ආස්වාදය දුක වශයෙන් නුවණින් දැකිය යුතු ය. එය සද්ධර්මය අසා හේතුඵල ධර්මය අවබෝධ කළ අරිය සාවකයන් පමණක් ප්‍රඥාවෙන් දකින්නා වූ සත්‍යයකි. **එබැවින් ආස්වාදය දුකක් ලෙස නුවණින් - ප්‍රඥාවෙන් දැකීම දුක්ඛ ආර්ය සත්‍යය නම් වෙයි. එය සංසාරයේ සැඟවී ඇති ඒකායන යථාර්ථය නුවණින් දැකීමයි.**

මෙම සාංසාරික යථාර්ථය නුවණින් නොදක්නාතුරු, ආස්වාදය සැපයකි යන චින්තන විපරීතය සත්වයා තුළ පවතී. අවිජ්ජාව යනු මෙම මුළා සහගත චින්තන විපරීතයයි. අවිජ්ජාව පවතිනතුරු පටිච්ච සමුප්පාදය ක්‍රියාත්මක වන බැවින්, අවිපරිණාමීය ආත්මයකින් තොර වූ අසාර වූ හේතුඵල සත්වයෙකු, අප්‍රමාණ දුක් උසුලමින් උපත සහ මරණය අතර දෝලනය වෙමින් සසර තුළ සැරිසරයි.

ආස්වාදය පතා මම මගේ යනුවෙන් සත්වයා විසින් සිතින් අල්ලා ගනු ලබන සියල්ල, අනිච්ච, දුක්ඛ, අනත්ත, අසුභ ලක්ෂණයන්ගෙන් යුක්ත වෙයි. ඒ සියල්ල ඊට හිමි ධර්මතාවන්ට අනුව පවතිමින් විපරිණාමය කරා ගමන් කර අවසානයේ මරණයෙන් කෙළවර වෙයි. එබැවින් ආස්වාදය පතා සත්වයා විසින් ලං කරගත් අචේතනික සචේතනික ද්‍රව්‍ය - වස්තු / සත්ව පුද්ගල ප්‍රපංච සියල්ල නිසා, මොහොතක් පාසා, ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස දුක් රැසට මුහුණ පෑමට සත්වයාට සිදුවෙයි. ආස්වාදය පතා තණ්හාවෙන් (ඇල්මෙන් - ආශාවෙන්) අල්ලා ගත් සියල්ල නිසා, සත්වයාට අප්‍රමාණ දුක්ඛස්කන්ධයක් උසුලන්නට සිදු වෙයි. තණ්හාවෙන් අල්ලා ගත් ද්‍රව්‍ය - වස්තු / සත්ව පුද්ගල ප්‍රපංචයන්ගේ ස්වභාවය අනුව, ප්‍රමාණය අනුව ඒ ඒ සත්වයා උසුලන දුක අඩු වැඩි වෙයි.

මාළුවා රසබර ඇමට රැවටී මරණීය බිලී කටුවට ගොදුරුව වැනසී යන්නාක් මෙන්, සත්වයා ආස්වාදය සැපයකැයි රැවටී ඒ පසුපස හඹා යාම හේතුවෙන්, ජාති, ජරා, ව්‍යාධි, මරණ, ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාග, ද්වේෂ, මෝහ යන එකොළොස් දුක්ඛයන්ගෙන් යුක්ත සංසාර බිලී කටුවට ගොදුරු වී වැනසී දුකට පත්වන වන බව නුවණින් - ප්‍රඥාවෙන් දැකීම, දුක්ඛ ආර්ය සත්‍යය අවබෝධ කිරීමයි.

ඇස - ප්‍රිය රූප / කණ - ප්‍රිය ශබ්ද / නාසය - ප්‍රිය ගන්ධ / දිව - ප්‍රිය රස / කය - ප්‍රිය පහස / මනස - ප්‍රිය අදහස් යනුවෙන් ඒ ඒ තැන්හී යෙදෙන ආස්වාදය බුක්ති විඳීමට, නැවත නැවත බුක්ති විඳීමට ඇතිවන

ඇල්ම - ආශාව නිසා, ඊට කටයුතු යෙදීමෙන්, රාග, ද්වේෂ, මෝහ (කර්ම) රැස්වී, පුනර්භවය සකස්වන බව නුවණින් - ප්‍රඥාවෙන් දැකීම, දුක්ඛ සමුදය ආර්ය සත්‍යය අවබෝධ කිරීමයි.

ආස්වාදය පිළිබඳ එම තණ්හාව - ඇල්ම - ආශාව, ශේෂ නොකොටම සහමුලින්ම ක්ෂය කර, බිඳ හැර, දුරු කොට සිත පිරිසිදු කර ගැනීම තුළින්, පුනර්භවයද ක්ෂය වී, මෙලොව පරලොව සියලු දුකින් අත මිදෙන බව නුවණින් - ප්‍රඥාවෙන් දැකීම, දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය අවබෝධ කිරීමයි.

ආස්වාදය පිළිබඳ එම තණ්හාව - ඇල්ම - ආශාව, ශේෂ නොකොටම සහමුලින්ම දුරු කිරීම උදෙසා පළමුව ලෝකෝත්තර සම්මාදිට්ඨියට පත් විය යුතු බවත්, එම සම්මාදිට්ඨිය තුළින් ආස්වාදයේ ආදීනව නුවණින් දකිමින් ලෝකෝත්තර ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩිය යුත් බවත්, නුවණින් - ප්‍රඥාවෙන් දැකීම, දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා ආර්ය සත්‍යය අවබෝධ කිරීමයි.

මෙම ආර්ය සත්‍යය හතර අවබෝධ කිරීම යනු, සම්මාදිට්ඨිය - විද්‍යාව පහළ කර ගැනීම හෙවත් නිවන් මඟට පැමිණීමයි.

යං ඛො, භික්ඛු, දුක්ඛෙ ඤාණං, දුක්ඛසමුදයෙ ඤාණං, දුක්ඛනිරොධෙ ඤාණං, දුක්ඛනිරොධගාමිනියා පටිපදාය ඤාණං - අයං වුච්චති, භික්ඛු, සම්මාදිට්ඨි, අයං වුච්චති, භික්ඛු, විජ්ජා. එත්තාවතා ච සම්මාදිට්ඨිගතො හොති, විජ්ජාගතො හොතී’ති.

මහණ, දුකෙහි යම් දැනීමක් වෙයිද දුකට හෙතුවෙහි යම් දැනීමක් වෙයිද දුක්ඛ නිරොධයෙහි යම් දැනීමක් වෙයිද දුක්ඛ නිරොධයට පැමිණෙන මාර්ගයෙහි යම් දැනීමක් වේද, මෙය සම්මාදිට්ඨියයි කියනු ලැබේ, මෙය විද්‍යාවයයි කියනු ලැබේ. මෙතෙකින් සම්මාදිට්ඨියට, විද්‍යාවට පැමිණියේ වෙයි.

## අවිද්‍යාත්මක චින්තනයේ නොහොත් අවිද්‍යාමූල අකුසල චින්තනයේ සහ විද්‍යාත්මක චින්තනය නොහොත් විජ්ජාමූල කුසල චින්තනයේ වෙනස

| අනාර්ය චින්තනය / අවිජ්ජාමූල අකුසල චින්තනය / අනුලෝම චින්තනය | ආර්ය චින්තනය / විජ්ජාමූල කුසල චින්තනය / පටිලෝම චින්තනය |
|---|---|
| කම් සැප උසුලමින් ආස්වාදය සොයමින් ජාති, ජරා, ව්‍යාධි, මරණ, සෝක පරිදේව, දුක්ඛ දෝමනස්ස, උපායාස අතරින් දිවෙන සංසාර භවය ඒකායන සැපයයි. | කම් සැප උසුලමින් ආස්වාදය සොයමින් ජාති, ජරා, ව්‍යාධි, මරණ, සෝක පරිදේව, දුක්ඛ දෝමනස්ස, උපායාස අතරින් දිවෙන සංසාර භවය ඒකායන දුකයි. |
| කාමය, ආස්වාදය පිළිබඳ තණ්හාව / ඇල්ම / ඡන්දරාගය මෙලොවද පරලොවද සසර සැප උදා කරයි. | කාමය, ආස්වාදය පිළිබඳ තණ්හාව / ඇල්ම / ඡන්දරාගය මෙලොවද පරලොවද සසර දුක උදා කරයි. |
| කාමය, ආස්වාදය පිළිබඳ තණ්හාව / ඇල්ම / ඡන්දරාගය දුරු කිරීම තුළින් මෙලොවද පරලොවද දුක උදාවෙයි. | කාමය, ආස්වාදය පිළිබඳ තණ්හාව / ඇල්ම / ඡන්දරාගය දුරු කිරීම තුළින් මෙලොවද පරලොවද දුක නිමාවෙයි. |
| කාමය, ආස්වාදය, පංච උපාදානස්කන්ධය පිළිබඳ ආදිනව මෙනෙහි කිරීම දුක උදා කරන මාර්ගයයි. | කාමය, ආස්වාදය, පංච උපාදානස්කන්ධය පිළිබඳ ආදිනව මෙනෙහි කිරීම සැප උදා කරන මාර්ගයයි. |

| අනාර්ය චින්තනය / අවිජ්ජාමූල අකුසල චින්තනය / අනුලෝම චින්තනය | ආර්ය චින්තනය / විජ්ජාමූල කුසල චින්තනය / පටිලෝම චින්තනය |
|---|---|
| කාමය, ආස්වාදය, පංච උපාදානස්කන්ධය සැප වශයෙන් දකියි. | කාමය, ආස්වාදය, පංච උපාදානස්කන්ධය දුක වශයෙන් දකියි. |
| කාමය, ආස්වාදය, පංච උපාදානස්කන්ධය කෙරෙහි තණ්හාව, ඇල්ම, ඡන්දරාගය සැප උදා කරන හේතුව වශයෙන් දකියි. | කාමය, ආස්වාදය, පංච උපාදානස්කන්ධය කෙරෙහි තණ්හාව, ඇල්ම, ඡන්දරාගය දුක උදා කරන හේතුව වශයෙන් දකියි. |
| කාමය, ආස්වාදය පිළිබඳ තණ්හාව / ඇල්ම / ඡන්දරාගය දුරු කිරීම දුක උදාවීම වශයෙන් දකියි. | කාමය, ආස්වාදය පිළිබඳ තණ්හාව / ඇල්ම / ඡන්දරාගය දුරු කිරීම සැප උදාවීම වශයෙන් දකියි. |
| කාමය, ආස්වාදය, පංච උපාදානස්කන්ධය පිළිබඳ ආනිසංස දකියි. | කාමය, ආස්වාදය, පංච උපාදානස්කන්ධය පිළිබඳ ආදීනව දකියි. |

සම්පාදනය - සුසිල හිමි.